# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 14 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 12.25 යි. **තැපැල් ගාස්තුව :** රු. 7 .50 යි.

## 2007 අංක 14 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 12 වන දින]

එල්. ඩී.—ඕ.3/2007.

### 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2007 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 5 වන වගන්තිය එහි (4) වන උපවගන්තියේ "ප්‍රතිෂ්ඨාව අඩු කළ විට ලැබෙන මුදල විය යුතු ය." යන වචන වෙනුවට "ප්‍රතිෂ්ඨාව අඩු කළ විට ලැබෙන මුදල විය යුතු ය: ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

එසේ වුව ද, යම් ලොතරැයියක් යටතේ සිදුකරන ලද සේවා සැපයීමක් සම්බන්ධව එම ලොතරැයි අළෙවි කිරීම වෙනුවෙන් යම් අනුයෝජිතයකුට කොමිස් මුදල මත, එකතු කළ අගය මත බද්ද ඇතුළුව කිසියම් කොමිස් මුදලක් ගෙවා ඇත්නම්, ඒ මුදල ද මේ උපවගන්තියේ සඳහන් කරන ලද අඩු කිරීම්වලට අමතරව අඩු කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ බදු අයකළ හැකි කාල සීමාව තුළ ඔහුගේ සැපයීම පිළිබඳ වාර්තාවක්" යන වචන වෙනුවට "ඒ බදු අයකළ හැකි කාල සීමාව තුළ ඔහුගේ සැපයීම පිළිබඳ ලියවිල්ලකින් නැතහොත් විද්‍යුත් මාධ්‍යයකින් වූ වාර්තාවක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ "රේගු ආඥාපනත යටතේ යම් තීරු බද්දක් ද" යන වචන වෙනුවට, "(235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ යම් තීරු බද්දක් හෝ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සෙස් බද්දක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ හතරවන අතුරු විධානයේ "මේ පනත යටතේ ඉඩහැරිය හැකි, හතරවන උපලේඛනයේ (සුබෝපභෝගී අනුප්‍රමාණය) නිශ්චිතව දැක්වෙන භාණ්ඩ හෝ සේවා මිල දී ගැනීම මත යම් තැනැත්තකු විසින් ගෙවන ලද යම් යෙදවුම් බද්දක් සියයට පහළොවකට සීමා කළ යුතු ය." යන වචන වෙනුවට "යම් ලියාපදිංචි තැනැත්තකු විසින් නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා සහ එසේ නිෂ්පාදිත භාණ්ඩ අපනයනය කිරීමේ කාර්යය සඳහා භාවිත කරන අමුද්‍රව්‍ය වශයෙන් පවතින යම් භාණ්ඩ ආනයනය කිරීමේ දී හෝ ඒවා ලැබීමේ දී, ඒ ලියාපදිංචි තැනැත්තා විසින් බන්ධිත ප්‍රදේශයකින් ලැබුන භාණ්ඩ කිසිවක් ද ඇතුළුව ආයනයන කරන ලද යම් භාණ්ඩ වෙනුවෙන් ගෙවිය යුතු වූ යෙදවුම් බද්දකට අදාළව හැර මේ පනත යටතේ ඉඩහැරිය හැකි, හතරවන උපලේඛනයේ (සුබෝපභෝගී අනුප්‍රමාණය) නිශ්චිතව දැක්වෙන භාණ්ඩ මිල දී ගැනීම හෝ ආනයනය කිරීම නැතහොත් සේවා මිල දී ගැනීම මත ඒ තැනැත්තා විසින් ගෙවන ලද යම් යෙදවුම් බද්දක් සියයට පහළොවකට සීමා කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "මේ පනත යටතේ ඉඩදිය හැකි යෙදවුම් බද්දේ ප්‍රමාණය, නිමැවුම් බද්දේ ප්‍රමාණය ඉක්මවන්නේ නම්" යන වචන වෙනුවට "(10) වන උපවගන්තියට යටත්ව මේ පනත යටතේ ඉඩදිය හැකි යෙදවුම් බද්දේ ප්‍රමාණය, නිමැවුම් බද්දේ ප්‍රමාණය ඉක්මවන්නේ නම්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ —

(අ) (ii) වන ඡේදයේ "බදු අය කළ හැකි ක්‍රියාකාරකමකට සම්බන්ධ නැතිනම්" යන වචන වෙනුවට, "බදු අයකළ හැකි ක්‍රියාකාරකමකට සම්බන්ධ නැතිනම් හෝ බද්දට යටත් සැපයුම් අගය සඳහා අඩු කිරීමක් ලෙස ගැනෙන සැපයුමකට සම්බන්ධ වේ නම්" ;

(ආ) දෙවන අතුරු විධානයේ "2003 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාල සීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2003 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 2007 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

(5) ඒ වගන්තියේ (9) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(10) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ බදු අයකළ හැකි යම් කාලසීමාවක් සඳහා ඉඩදිය හැකි යෙදවුම් බද්දේ ප්‍රමාණය, ඒ බදු අයකළ හැකි කාලසීමාව සඳහා මේ පනතේ විධිවිධාන යටතේ ඉඩදිය හැකි යෙදවුම් බද්ද හෝ ප්‍රකාශයට පත් කර ඇති නිමැවුම් බද්දෙන්, සියයට අසූපහ යන ප්‍රමාණවලින් අඩු ප්‍රමාණයකට තවදුරටත් සීමා කළ යුතු ය. කෙසේ වුව ද සියයට අසූපහක අනුප්‍රමාණයට සීමා කරන ලද 22 වන වගන්තියේ (5) වන උපවගන්තියේ තුන්වන අතුරු විධානයේ සඳහන් කර ඇති පිරිසැකසුම් නොකර නැවත විකිණීම සඳහා භාණ්ඩ ආනයනය කරන ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් 2006 දෙසැම්බර් මස 31 වන දිනට අතිරික්ත යෙදවුම් බද්ද ඇතුළුව ඉඩ දිය හැකි යෙදවුම් බද්දෙන් යම් ශේෂයක් ඉතිරි වී ඇත්නම්, එය එම සීමාකිරීමට ම යටත්ව පසුව එළඹෙන බදු අයකළ හැකි කාලසීමාවක් හෝ කාලසීමා තුළ ඉඩදිය හැකි යෙදවුම් බද්දේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඉහත සීමා කිරීම්—

(i) ශුන්‍ය අනුප්‍රමාණගත කර ඇති සැපයුම්වලට;

(ii) 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩල පනත යටතේ පිහිටුවා ලියාපදිංචි කළ රෙදිපිළි පංගු මණ්ඩලයේ හෝ 1979 අංක 40 දරන අපනයන සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි අපනයනකරුවන් වෙත 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් කරන ලද, අවස්ථාවෝචිත පරිදි, රෙදිපිළි පංගු මණ්ඩලයේ හෝ අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි තැනැත්තකු විසින් සැපයුම් කරන්නා වූ මේ පනත යටතේ බදු විලම්භනය කිරීමකින් වූ සැපයුම්වලට ; සහ

(iii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ දී 22 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති ලියාපදිංචි තැනැත්තකු විසින් වියදම් කරන ලද භාණ්ඩ හෝ සේවා වලට අදාළ ව්‍යාපෘතිවල දී,

ආරෝපිත යෙදවුම් බද්ද සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ඔහුට හිමිකම ලැබිය යුතු ය." යන වචන වෙනුවට, "ඔහුට හිමිකම ලැබිය යුතු ය:

එසේ වුව ද, මුල් බදු ඉන්වොයිස් පත්‍රයක් මත අඩුවෙන් ඉල්ලා ඇති යෙදවුම් බද්ද සම්බන්ධයෙන් වූ ඉල්ලීම මත බදු ප්‍රමාණය ගැලපීම බදු හර නෝට්ටුවට හෝ බදු බැර නෝට්ටුවට අදාළ වන්නා වූ මූලික බදු ඉන්වොයිස් පත්‍රය නිකුත් කිරීමෙන් පසු මාස හයකට නොඅඩු කාලයක දී නිකුත් කරන ලද ඒ බදු බැර නෝට්ටු හෝ බදු හර නෝට්ටු සම්බන්ධයෙන් පමණක් සිදු කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ IIIආ අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ IIIඅ පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ IIIආ පරිච්ඡේදය (25ඌ වගන්තියේ සිට 25එ වගන්තිය දක්වා) ලෙස බලපැවැත්විය යුතු ය:—

"IIIආ පරිච්ඡේදය

වෛකල්පිත එකතු කළ අගය මත බදු පැනවීම.

25ඌ (1) මෙහි මින් මතු "වෛකල්පිත එකතු කළ අගය මත බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන බද්දක් ශ්‍රී ලංකාව තුළ යම් බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යන්නා වූ, මේ පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව බදු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක මුළු පිරිවැටුම මත 2007 ජනවාරි මස 1 වන දිනයෙන් හෝ ඉන්පසුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා ම සියයට පහක අනුප්‍රමාණයකින් අය කර ගනු ලැබිය යුතු ය.

(2) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා—

යම් බදු අයකළ හැකි ක්‍රියාකාරකමකට අදාළව "පිරිවැටුම" යන්නෙන්, පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති සැපයුම් කිසිවක් හෝ 7 වන වගන්තියේ දක්වා ඇති ශුන්‍ය අනුප්‍රමාණගත කළ සැපයුම් හෝ මේ පනතේ 3 වන වගන්තියේ දක්වා ඇති හෝ ප්‍රාග්ධන වත්කම් කිසිවක් විකිණීම සඳහා වූ සැපයීම් හැර ශ්‍රී ලංකාව තුළ ආරම්භ කරන ලද හෝ කරන ලද බදු

අයකළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඇතුළත්වූ ගණුදෙනුවලින් ලැබුන හෝ ලැබිය හැකි මුළු මුදල් ප්‍රමාණය අදහස් වේ.

(3) මේ උපවගන්තියේ සඳහන්—

"ප්‍රාග්ධන වත්කම්" යන්නට, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 25 වන වගන්තියේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

"කාර්තුව" යන්නෙන්, එක් එක් වර්ෂයේ පිළිවෙලින් ජනවාරි මස පළමුවන දිනයෙන්, අප්‍රේල් මස පළමුවන දිනයෙන්, ජූලි මස පළමුවන දිනයෙන් සහ ඔක්තෝබර් මස පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලසීමාව අදහස් වේ.

ලියාපදිංචි කිරීම.

25එ. (1) (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ හැකි අතර—

(අ) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) වන සහ (ii) වන අනු ඡේදවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසි සම්පූර්ණ කර ඇති බවට සෑහීමට පත්වේ නම්, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ලියාපදිංචි වීම සඳහා කරන ලද ඉල්ලීම මත, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු අතර, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය සඳහා ලියාපදිංචි කිරීමේ අංකයක් වහාම ලබා දිය යුතු ය;

(ආ) ලියාපදිංචිය ලබා ගත් කාර්තුව ආරම්භ වන දිනයෙන් වසර තුනක කාලයක් සඳහා හෝ එම තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ මුළු පිරිවැටුම වර්ෂයකට රුපියල් ලක්ෂ විසිපහක් වන්නේ කවර කාර්තුවක දී ද, එම කාර්තුවේ අවසානය දක්වා යන ඒවායින් පළමුව එළඹෙන අවස්ථාව දක්වා ඒ ලියාපදිංචි කිරීම වලංගු විය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(i) කරගෙන යන සෑම බදු අය කළ හැකි ක්‍රියාකාරකමක ම මුළු පිරිවැටුම වසරකට රුපියල් ලක්ෂ විසිපහක් නොඉක්මවන්නා වූ හෝ කාර්තුවකට රුපියල් හය ලක්ෂ විසිපන්දහසක් නොඉක්මවන්නා වූ; සහ

(ii) II වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි වී නොමැති වන්නා වූ,

යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(ආ) මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි වූ යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ඒ ලියාපදිංචිය අවලංගු කර ගැනීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ හැකි අතර, මේ පරිච්ඡේදය යටතේ ඒ ලියාපදිංචිය පවතින කාලය තුළ ඕනෑම වේලාවක දී II වන පරිච්ඡේදය යටතේ තමා ලියාපදිංචි කරන ලෙසට කොමසාරිස් ජනරාල්වරයාගෙන් වැඩිදුරටත් ඉල්ලා සිටිය හැකි ය.

(ඇ) මේ පරිච්ඡේදය යටතේ යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයක ලියාපදිංචිය පවතින කාලය තුළ දී ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය වෙනුවෙන් I වන, II වන, III වන හෝ IIIඅ වන පරිච්ඡේදවල විධිවිධාන අදාළ කර ගනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 26අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"ගෙවීම්වලින් බදු අඩු කිරීම.

26අ. (1) යම් රජයේ නියෝජ්‍යායතනයක් කොටස්කරුවකු ලෙස හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් කොටස්කරුවකු ලෙස ගිවිසුමකට බැඳී සිටින විට ඒ

ගිවිසුමට අනුව ගෙවීමක් සිදු කරන එවැනි සෑම නියෝජ්‍යායතනයකින් ම ඒ ගෙවීම තුළ ඇතුළත් බදු මුදලින් තුනෙන් එකක් අඩු කරනු ලැබිය යුතු ය. එසේ අඩු කරගත් බදු මුදල් ප්‍රමාණය එම රජයේ නියෝජ්‍යායතනයෙන් ජනරජයට අයවිය යුතු ණය මුදලක් විය යුතු අතර, නොපමාව අයකර ගනු ලැබිය යුතු ය ; නැතහොත් මේ පනත යටතේ එම රජයේ නියෝජ්‍යායතනය විසින් ගෙවිය යුතු වෙනත් බද්දක් ඇත්නම් ඊට අතිරේකව ඒවායින් තක්සේරු කර අයකර ගනු ලැබිය හැකි ය :

එසේ වුව ද,—

(i) ඒ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවිය යුතු මුළු ප්‍රතිෂ්ඨාව එකතු කළ අගය මත බද්ද හැර, රුපියල් ලක්ෂ පහකට වඩා වැඩි නොවන අවස්ථාවක ; හෝ

(ii) ගිවිසුම මත භාණ්ඩ සැපයීම එසැනින් නිරවුල් කර ගැනීම සඳහා කරන ලද ගෙවීමක් වන අවස්ථාවක දී ; හෝ

(iii) සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගනිමින්, කොමසාරිස් ජනරාල්වරයා ඒ බදු අඩු කිරීම ක්‍රියාවේ යෙදවිය නොහැකි බවට හෝ යෝග්‍ය නොවන බවට අදහස් කරන අවස්ථාවක දී,

කිසිදු අඩු කිරීමක් සිදු කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව බදු අඩු කරන රජයේ යම් නියෝජ්‍යායතනයක් විසින්—

(අ) ගෙවීමකින් අඩුකරගන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා වෙත ඒ අඩු කර ගැනීම පිළිබඳව පහත දැක්වෙන කරුණු දක්වමින් ප්‍රකාශයක් නිකුත් කළ යුතු ය ;

(i) ගෙවිය යුතු දළ මුදල් ප්‍රමාණය ;

(ii) මුළු බදු මුදල සහ එසේ අඩු කර ගන්නා ලද බදු මුදලින් තුනෙන් එකක ප්‍රමාණය ; සහ

(iii) සත්‍ය වශයෙන් ගෙවන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය; සහ

(ආ) කිසියම් ලිත් මාසයක ඊලඟ මාසයේ පළමු සතිය අවසාන වීමට පෙරාතුව එසේ අඩු කර ගත් බදු මුදල පහත දැක්වෙන කරුණු ඇතුළත් ප්‍රකාශයක් ද සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය:—

(i) ගෙවීම කරනු ලැබුවේ කවර තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය සහ ඒ තැනැත්තාගේ ලියාපදිංචි අංකය ;

(ii) එසේ ගෙවන ලද දළ මුදල් ප්‍රමාණය ;

(iii) මුළු බදු මුදල් ප්‍රමාණය, අඩු කර ගත් බදු මුදලින් තුනෙන් එකක ප්‍රමාණය සහ සත්‍ය වශයෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය ;

(iv) ගෙවීම සිදු කරනු ලැබූ රජයේ නියෝජ්‍යායතනයේ නම සහ ලිපිනය සහ ලියාපදිංචි අංකය (තිබේ නම්) ; සහ

(v) ප්‍රේෂණවල විස්තර, චෙක්පත් අංක සහ ගෙවීම කරන ලද දිනය.

(3) යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි සැපයුම්වල (1) වන සහ (2) වන උපවගන්ති යටතේ බදු මුදලින් අඩු කරන ලද සහ ප්‍රේෂණය කරන ලද යම් මුදලක් ඇතුළත් වන අවස්ථාවක, ඒ මුදලට අදාළව (2) වන උපවගන්තියට අනුව නිකුත් කරන ලද සහතිකය ඉදිරිපත් කිරීම මත ඒ සහතිකයේ අඩු කරන ලද බදු මුදල වශයෙන් දක්වා ඇති මුදල් ප්‍රමාණය, ඔහු විසින් ගෙවිය යුතු බද්දට හිලව් කිරීමට ඔහුට හිමිකමක් තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා—

"ගිවිසුම" යන්නෙන්,—

(i) සේවයේ නියුක්තවීම පිළිබඳ ගිවිසුමක් නොවන්නා වූ ද, ඉදිකිරීම් වැඩ හෝ කවර ස්වභාවයක හෝ සේවා සම්බන්ධයෙන් වූ ද යම් ගිවිසුමක් ;

“



(ii) (i) වන අනු-ඡේදයේ නිශ්චිතව දැක්වෙන යම් ගිවිසුමක් සම්බන්ධයෙන් වූ භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වූ යම් ගිවිසුමක් ;

(iii) (i) වන අනු-ඡේදයේ හෝ (ii) වන අනු-ඡේදයේ නිශ්චිතව දැක්වෙන යම් ගිවිසුමක් සම්බන්ධයෙන් වූ උපගිවිසුමක් ; හෝ

(iv) සේවයේ නියුක්තවීම පිළිබඳව ගිවිසුමක් නොවන විනෝදය සපයන්නකු හෝ කලාකරුවකු වශයෙන් සේවා සැපයීම සඳහා වූ ගිවිසුමක් ඇතුළුව සේවා සැපයීම සඳහා වූ යම් ගිවිසුමක්,

අදහස් වේ.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා “රජයේ නියෝජ්‍යායතන” යන්නට යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, රජයට අයත් ව්‍යාපාර ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක්, විශ්ව විද්‍යාලයක්, රාජ්‍ය බැංකුවක්, ඒකාබද්ධ අරමුදලින් මුදල් සපයනු ලබන ආණ්ඩුවේ ආයතනයක් මගින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක් සහ ආයෝජන මණ්ඩලය අදහස් වේ.

(6) යම් තැනැත්තෙක් (1) වන උපවගන්තිය ප්‍රකාරව බදු අඩු කිරීම පැහැර හරින හෝ (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු යම් බද්දක් ප්‍රේෂණය කිරීම පැහැර හරින අවස්ථාවක එම බද්ද ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බදු අයකර ගැනීමට අදාළව මේ පනතේ ඇති විධිවිධාන එවැනි යම් බදු පැහැර හැරීමක් සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

(7) (1) වන උපවගන්තිය යටතේ යම් අඩු කිරීමක් සිදු කර ඇති හෝ (2) වන උපවගන්තිය ප්‍රකාරව යම් ප්‍රේෂණය කිරීමක් සිදු කර ඇති යම් තැනැත්තෙක් බදු ගෙවිය යුතු තැනැත්තාගේ සහ වෙනත් අදාළ සියලු

තැනැත්තන්ගේ බලය යටතේ ක්‍රියා කර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ කොන්ත්‍රාත්තුවක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අවස්ථෝචිත පරිදි, අඩු කිරීම හෝ ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යවල දී එම තැනැත්තා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියේ (1) වන උපවගන්තියේ 3 වන අතුරු විධානයේ "ත්‍රිරෝද රථ සඳහා කල්බදු පහසුකම් සැපයීම සම්බන්ධ අවස්ථා හැර," යන වචන අත්හැරීමෙන් සහ "නිදහස් කළ හැකි සැපයුමක් බවට පත්වන" යන වචන වෙනුවට "නිදහස් කළ හැකි සැපයුමක් බවට, 2006 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර පත්වන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපලේඛනයේ (අ) ඡේදයේ—

(අ) (vi) වන අයිතමයේ "ගුවන් යානා ඉන්ධන සහ නැව් සඳහා තෙල්" යන වචන වෙනුවට, "ගුවන් යානා ඉන්ධන, නැව් සඳහා තෙල් හෝ නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 2710. 19. 60 යටතේ දැක්වෙන ඉන්ධන තෙල්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

(ආ) (vii) වන අයිතමයේ "බ්‍රේල් ලියන පුවරු" යන වචන වෙනුවට, "බ්‍රේල් ලියන පුවරු සහ ඒ සඳහා ආබාධිත තැනැත්තන් විසින් කරන ලද ඉල්ලීමක් මත එම තැනැත්තන් විසින් ඉල්ලා ඇති සහනවල ප්‍රමාණය සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ, ආබාධිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වෙනත් යම් භාණ්ඩයක්" යන වචන ආදේශ කිරීමෙන්.

(ඇ) (xiv) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් :—

"(xv) ඉස්සන්".

(2) එහි (ආ) ඡේදයේ—

(අ) (xvi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන් :—

"(xvii) යම් චිත්‍රපටයක් බෙදා හැරීම හෝ ප්‍රදර්ශනය කිරීම ;

(xviii) යම් චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සඳහා වූ විද්‍යාගාර පහසුකම්;

(xix) දේශීය වශයෙන් නිෂ්පාදිත අත්කම් රෙදි;

(xx) දේශීය වශයෙන් නිෂ්පාදිත පොල්තෙල්;

(xxi) යම් යාත්‍රාවක් කුලියට ගැනීමක් වන සේවා,";

(ආ) එහි (i) (අ) අයිතමයේ "ආණ්ඩුවේ විෂයය මාලාව අනුගමනය කරන" යන වචන වෙනුවට "ආණ්ඩුවේ විෂයමාලාවට ඇතුළත් නොවන අධ්‍යාපන සේවා හෝ එවැනි අධ්‍යාපන සේවාවල යම් කොටසකට ඇතුළත් නොවන යම් සේවයක් හැර, ආණ්ඩුවේ විෂයය මාලාව අනුගමනය කරන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) එහි (ii) වන අයිතමය ඉවත් කර පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"(ii) (අ) (ගුවන් ප්‍රවාහනය, ජල මත ප්‍රවාහනය හෝ සංචාරකයන් ප්‍රවාහනය කිරීම, විනෝද චාරිකා සහ කුලී මෝටර් රථ සේවා හැර) පොදු මගී ප්‍රවාහන සේවා ; හෝ

(ආ) අ මගීන් විසි අට දෙනකුට නොඅඩු ආසන ගණනකින් යුක්ත යම් මෝටර් කෝච් රථයක් සහ 2004 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව කල්බදු ගිවිසුමට ඇතුළත් වී ඇත්නම් එය පොදු මගී ප්‍රවාහන සේවාවක් සඳහා භාවිත කිරීම සඳහා ;

ආ 2005 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව බදු වාරිකය ගෙවීමට නියමිත ත්‍රී රෝද රථ සඳහා ;

ඇ (ඈ) ඡේදයේ (xv) වන අයිතමයේ සඳහන් කරන ලද යම් බස් රථයක් සඳහා,

කල්බදු පහසුකම් සැපයීම.";

(ඈ) (iii) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"(iii) විදුලිබලය බෙදාහැරීම ද ඇතුළුව.".

(3) එහි (ඈ) ඡේදයේ, (xii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"(xiii) විදුලිබලය උත්පාදනය කිරීමේ කාර්යය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය හෝ ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති යම් ආයතනයක් විසින්, රේගු කාර්යය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගන්නා ලද යන්ත්‍ර හා උපකරණ අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව ආනයනය කිරීම;

(xiv) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කර, ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිවරයාගේ අනුමතය ඇතිව, වැඩිදුරටත් වූ පිරිසැකසුම් කිරීම හෝ මුද්‍රණය කිරීම සඳහා විදේශීය රටකට යවන යම් සිනමා පටයක් ආනයනය කිරීම ;

(xv) ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව විසින් හෝ කිසියම් පළාත්බද මාර්ග මගී ප්‍රවාහන අධිකාරියක් විසින් නිකුත් කරනු ලැබූ යම් වලංගු මගී සේවා අවසර පත්‍රයක් දරන්නකු විසින් මගී ප්‍රවාහනය සඳහා භාවිත කරමින් තිබෙන සහ ආනයනය කරන අවස්ථාවේ වසර පහකට නොඅඩු කාලයක් සඳහා, එසේ භාවිත කර ඇති බස්රථයක් වෙනුවට වූ යම් බස්රථයක් ආනයනය කිරීම ;

(xvi) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය ඇතිව කර්මාන්ත ශාලා අයිතිකරුවන් විසින් කර්මාන්තශාලා නවීකරණය කිරීම සඳහා යොදන යන්ත්‍ර ආනයනය කිරීම ;

(xvii) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් කුකුළන් ඇතිකිරීමේ උපකරණ, ඉන්කියුබේටර්, බිත්තර රකින යන්ත්‍ර, අභිජනන කාර්ය සඳහා ගවයන්, මී ගවයන්, කුකුළන්, ඌරන්, එළුවන්, බැටළුවන් සහ අභිජනන කාර්ය සඳහා එම සතුන්ගේ ශුක්‍රාණු සහ කළල, කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය ඇතිව ආනයනය කිරීම ;

(xviii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත පාවහන් සෑදීමේ කර්මාන්තය සඳහා භාවිත කරන පදම් කළ සම් ආනයනය කිරීම.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන් වන උපලේඛනය සංශෝධනය කිරීම.

" "(1) පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම හෝ ආනයනය" යන වචන වෙනුවට, "(1) පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම හෝ ආනයනය" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් ;

(2) (vi) වන අයිතමය ඉවත්කොට, (vii) වන අයිතමය (vi) වන අයිතමය වශයෙන් නැවත අංක යෙදීමෙන් ;

(3) (vi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම ඇතුළත් කිරීමෙන් :—

"(vii) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනා ගත් උසස් තාක්ෂණයෙන් යුත් වෛද්‍ය උපකරණ හෝ ටිකට් නිකුත් කිරීමේ යන්ත්‍ර නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන යම් යන්ත්‍රයක් ;

(viii) ස්වර්ණාභරණ ;";සහ

(4) එහි (viii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"(2) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුනා ගත් ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිවරයා විසින් අනුමත කරනු ලබන සිනමාපට, විකසනය කර ප්‍රදර්ශනය කරන ලද චිත්‍රපට, චුම්බක සිනමා ශබ්ද පටිගත කිරීමේ යන්ත්‍ර, චිත්‍රපට කැමරා හා ප්‍රක්ෂේපණ යන්ත්‍ර, ඒවායේ කොටස් හා උපාංග, චිත්‍රපට රසායනාගාර සඳහා අවශ්‍ය මෙවලම් සහ උපකරණ ආනයනය කිරීම.".

අතීතයට බලපෑම.

**11.** (1) පළමුවන උපලේඛනයේ (ආ) ඡේදයේ (xx) වන අයිතමයට කරන නිදහස් කිරීම ඇතුළත් කිරීම හැර, මේ පනතේ විධිවිධාන මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2007 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (ආ) ඡේදයේ (xx) වන අයිතමයට ඇතුළත් කරන ලද නිදහස් කිරීම, සියලු කාර්ය සඳහා 2006 ජූලි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

වගකීමෙන් ආරක්ෂා කිරීම.

**12.** 2007 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාලය ඇතුළත මේ පනත මගින් විධිවිධාන සළසා ඇති පරිදි එකතු කළ අගය මත බදු එකතු කර ගන්නා යම් තැනැත්තෙක් නිසි බලය ඇතිව ක්‍රියා කර ඇති බවට සලකනු ලැබිය යුතු අතර එවැනි එකතු කර ගැනීමක් සියලු කාර්ය සඳහා වලංගු පරිදි සිදු කර ඇති බවට සහ එසේ සිදු කරනු ලබන බවට සලකනු ලැබිය යුතු අතර එම තැනැත්තා එසේ එකතු කර ගැනීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව මෙයින් වගකීමෙන් ආරක්ෂා කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇතිවූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.